# පුංචි පූස් පැටියාට පුංචි ගෙයක්



සනිත්මා චන්තුලි සමරකෝන්

# පුංචි පූස් පැටියට පුංචි ගෙයක්

සනිත්මා චන්තුලි සමරකෝන්

පුංචි පූස් පැටියාට පුංචි ගෙයක්

සනිත්මා චන්තුලි සමරකෝන්

සියලුම හිමිකම් ඇවිරිණි.

<u>කතෘගේ වෙනත් කෘතීන්</u>

අමුතු පූස් පැටියා

ප්‍රකාශනය 2023 දෙසැම්බර්

ISBN 978-624-206-811-4

## පිදුම

මට කතන්දර කියා දෙන මගේ අත්තම්මාට

හැමදාම මට පෙනෙන්න පොත් කියවන අත්තාට

මට කතා පොත් ගෙනත් දෙන මගේ අම්මාට

ඒ පොත් වලට ආදරේ කරන්න මට කියාදෙන අප්පච්චීට

මා එක්ක පොත් කියවන මගේ අයියාට

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු, සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න, දැනුමෙන් යුත්, බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.11.01

එකොමත් එක කාලෙක පුංචි පූස් පැටියෙක් හිටියා.
එයා හිටියේ මහ පාරෙ.



එයාට කන්න බොන්න දෙයක් තිබුණේ නැහැ.

යාළුවෙක් හිටියෙත් නැහැ.

එයා හිටියේ හරිම දුකෙන්.



එක දවසක් එයා කුණු බක්කියක් අවුස්ස අවුස්ස ඉන්නකොට, පුංචි අඩි සද්දයක් ඇහුණා.

පූස් පැටියා හොඳටම බය වුණා.

දුවන්න ලෑස්ති වුණා.



ඒත් ඒ ආවේ පුංචි බබෙක්.

හරිම කරුණාවන්ත පාටයි.

පුංචි බබා පූස් පැටියා ළඟට ඇවිත් හිමීට එයාව වඩාගත්තා.



පූස් පැටියාත් රස්නෙට තුරුලු වුණා.

බබා පූස් පැටියාව ගෙදර ගෙනිච්චා.



අම්මාගෙනුයි තාත්තාගෙනුයි පූස් පැටියාව තියාගන්න අවසර ගත්තා.

එයාලා බබාට අවසර දුන්නා.



බබා සතුටින් උඩ පැන්නා.

පූස් පැටියාටත් හරිම සතුටුයි.



බබා පූස් පැටියාව නාවලා, කෑම කන්න දීලා ඉන්නකොට තමයි මතක් වුණේ පූස් පැටියාට නිදාගන්න තැනක් නැහැ කියලා.

ඉතිං එදා රෑ පූස් පැටියාට පරණ මෙට්ටයක් උඩ නිදාගන්න වුණා.



පහුවදා නිවාඩු දවසක්.

බබා ඇහැරුණු ගමන්ම තාත්තා ළඟට දුවලා ගිහින් මෙහෙම කිව්වා.

“අනේ තාත්තේ... අපි පූස් පැටියාට ගෙයක් හදමුකෝ...”



ඒ වැඩේට තාත්තත් කැමති වුණා.

ඉතිං තාත්තයි දුවයි දෙන්නාම වැඩ!

හවස් වෙද්දි ලස්සන පුංචි ගෙයක් හදලා ඉවර කරන්න එයාලාට පුලුවන් වුණා.



පූස් පැටියාට හරිම සතුටුයි.

එයා ඒක ඇතුළට ගිහිල්ලා හිතේ හැටියට නිදාගත්තා.



දැන් පූස් පැටියාට මොනවාද අඩු?

කන්න තියෙනවා... පුංචි ගෙයක් තියෙනවා...

ඒ විතරක්ද? දැන් එයාට පුංචි යාළුවෙකුත් ඉන්නවා.

ඒ කවුද?

පුංචි බබා!



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01